IslamHouse.com

සූරත් අෂ් ෂුඅරා -26

(කවි හු)

ආයත් 1-227 දක්වා.

අල් කුර්ආනය

< සිංහල Sinhala>

මාහිර් රම්ඩීන්
පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය
විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الشعراء - 26

من أول الآية حتى 227

< سنهالي >

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد و نخبة من العلماء الكبار

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

بِسْمِ اللهِ الرَّحمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1,2. ශුද්ධ වූ අල් කුර්ආනයේ ස්වභාවය.

طسم {1}
තා, සීන්, මීම්

تِلْكَ آيَاتُ الْكِتَابِ الْمُبِينِ {2}
එය පැහැදිලි දේව ග්‍රන්ථයේ වදන්ය.

3-9. අල්ලාහ්ගේ දූතයාණන් හා අල්ලාහ්ගේ සංඥා පිළිබඳ ව දේව ආදේශකයින්ගේ ස්ථාවරය. නබි තුමාණෝ ඔවුන් කෙරෙහි ශෝක වීම.

لَعَلَّكَ بَاخِعٌ نَفْسَكَ أَلَّا يَكُونُوا مُؤْمِنِينَ {3}
ඔවුහු දෙවියන් කෙරෙහි විශ්වාස කරන්නන් නොවීම හේතුවෙන් නුඹ නුඹගේ ආත්මය විනාශ කරගන්නට තැත් කරන්නාක් මෙනි.

إِنْ نَشَأْ نُنَزِّلْ عَلَيْهِمْ مِنَ السَّمَاءِ آيَةً فَظَلَّتْ أَعْنَاقُهُمْ لَهَا خَاضِعِينَ {4}
අපි අභිමත කරන්නේ නම් අහසින් සංඥාවක් ඔවුනට එරෙහි ව අපි පහළ කරන්නෙමු. එවිට ඔවුන්ගේ ගෙලවල් එයට යටහත් වන්නන් බවට පත් වනු ඇත.

وَمَا يَأْتِيهِمْ مِنْ ذِكْرٍ مِنَ الرَّحْمَٰنِ مُحْدَثٍ إِلَّا كَانُوا عَنْهُ مُعْرِضِينَ {5}
මහා කරුණාන්විතයාණන්ගෙන් යම් නව මෙනෙහි කිරීමක් ඔවුන් වෙත පැමිණියේ නැත. ඔවුහු ඒ ගැන පිටුපාමින් සිටියා මිස.

فَقَدْ كَذَّبُوا فَسَيَأْتِيهِمْ أَنْبَاءُ مَا كَانُوا بِهِ يَسْتَهْزِئُونَ {6}
එවිට සැබැවින්ම ඔවුහු බොරු කළෝය. එහෙයින් ඔවුහු කවර දෙයක් ගැන සරදම් කරමින් සිටියෙහු ද එහි පුවත ඔවුන් වෙත මතු පැමිණෙනු ඇත.

أَوَلَمْ يَرَوْا إِلَى الْأَرْضِ كَمْ أَنْبَتْنَا
එහි අපි ගරුසැරුති සෑම ජෝඩුවකින්ම කොපමණක් දෑ හට

فِيهَا مِنْ كُلِّ زَوْجٍ كَرِيمٍ {7}

ගන්වා ඇති දැයි මහපොළොව දෙස ඔවුහු නොබැලුවෙහු ද?

إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {8}

නියත වශයෙන්ම එහි සංඥාවක් ඇත. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් කෙරෙහි විශ්වාස කරන්නන් නොවූහ.

وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {9}

තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන්, මහා කරුණාන්විතයාණන් වූ සර්ව බලධාරී ඔහුමය.

10-51. මූසා (අලයිහිස් සලාම්) තුමා හා ෆිර්අවුන්. හූනියම්කරුවන් දෙවියන් විශ්වාස කිරීම.

وَإِذْ نَادَىٰ رَبُّكَ مُوسَىٰ أَنِ ائْتِ الْقَوْمَ الظَّالِمِينَ {10}

අපරාධකාරී ජනයා වෙත නුඹ යනු යි මූසාට නුඹගේ පරමාධිපති ඇමතූ අවස්ථාව සිහියට නගනු.

قَوْمَ فِرْعَوْنَ ۚ أَلَا يَتَّقُونَ {11}

ෆිර්අවුන්ගේ ජනයා වෙත ඔවුහු බිය බැතිමත් විය යුතු නොවේ ද?

قَالَ رَبِّ إِنِّي أَخَافُ أَنْ يُكَذِّبُونِ {12}

මාගේ පරමාධිපතියාණනි, ඔවුන් මා බොරු කරනු ඇතැයි නියත වශයෙන්ම මම බිය වෙමි යැයි ඔහු පැවසුවේය.

وَيَضِيقُ صَدْرِي وَلَا يَنْطَلِقُ لِسَانِي فَأَرْسِلْ إِلَىٰ هَارُونَ {13}

මාගේ හදවත පීඩනයට පත් ව ඇත. මාගේ දිව ක්‍රියාකාරී නොවෙයි. එහෙයින් හාරූන් වෙත ද (දේව පණිවිඩ) නුඹ එවනු.

وَلَهُمْ عَلَيَّ ذَنْبٌ فَأَخَافُ أَنْ يَقْتُلُونِ {14}

මා වෙත පැටවුණු පාපයක් ඔවුන් සතු ව ඇත. එහෙයින් ඔවුහු මා මරා දමනු ඇතැයි මම බිය වෙමි.

قَالَ كَلَّا ۖ فَاذْهَبَا بِآيَاتِنَا ۖ إِنَّا مَعَكُمْ مُسْتَمِعُونَ {15}

එසේ නොව, අපගේ සංඥා රැගෙන නුඹලා දෙදෙනා යනු. නියත වශයෙන්ම අපි නුඹලා සමග සිට සවන් දෙන්නෝ වෙමු.

فَأْتِيَا فِرْعَوْنَ فَقُولَا إِنَّا رَسُولُ رَبِّ الْعَالَمِينَ {16}

أَنْ أَرْسِلْ مَعَنَا بَنِي إِسْرَائِيلَ {17}

එහෙයින් නුඹ දෙදෙනා ෆිර්අවුන් වෙත ගොස් නියත වශයෙන්ම අපි සර්ව ලෝකයන්හි පරමාධිපතිගේ දහම් දූතයන් වෙමු යැයි ද අප සමඟ ඉස්රාඊල් දරුවන් යවන මෙන් ද නුඹ දෙදෙනා පවසනු.

قَالَ أَلَمْ نُرَبِّكَ فِينَا وَلِيدًا وَلَبِثْتَ فِينَا مِنْ عُمُرِكَ سِنِينَ {18}

අපි නුඹ ව අප තුළ දරුවකු සේ හදා වඩා නොගත්තෙමු ද? නුඹගේ ආයු කාලයෙන් වසර ගණනාවක් නුඹ අප අතර රැඳී සිටියෙහිය යැයි ඔහු පැවසීය.

وَفَعَلْتَ فَعْلَتَكَ الَّتِي فَعَلْتَ وَأَنْتَ مِنَ الْكَافِرِينَ {19}

තවද නුඹ ගුණමකුවන් අතුරින් සිටිය දී නුඹ සිදු කළ නුඹගේ ක්‍රියාව නුඹ සිදු කළෙහිය.

قَالَ فَعَلْتُهَا إِذًا وَأَنَا مِنَ الضَّالِّينَ {20}

මුළාවූවන් අතුරින් කෙනෙකු ව මා සිටිය දී එවිට මම එය සිදු කළෙමි යැයි ඔහු පැවසීය.

فَفَرَرْتُ مِنْكُمْ لَمَّا خِفْتُكُمْ فَوَهَبَ لِي رَبِّي حُكْمًا وَجَعَلَنِي مِنَ الْمُرْسَلِينَ {21}

එවිට මම නුඹලාට බිය වූ කල්හි මම නුඹලාගෙන් පලා ගියෙමි. එවිට මාගේ පරමාධිපති මට ප්‍රඥාව ප්‍රදානය කළේය. මා දහම් දූතයින් අතුරින් කෙනෙකු බවට පත් කළේය.

وَتِلْكَ نِعْمَةٌ تَمُنُّهَا عَلَيَّ أَنْ عَبَّدْتَ بَنِي إِسْرَائِيلَ {22}

තවද එය ආශිර්වාදයකි. ඉස්රාඊල් දරුවන් (ෆිර්අවුන් වන) නුඹ වහල් භාවයට පත් කරමින් නුඹ මට එය

කියා පෙන්වන්නෙහිය.

قَالَ فِرْعَوْنُ وَمَا رَبُّ الْعَالَمِينَ {23}

සර්ව ලෝකයන්හි පරමාධිපති යනු කවරෙක් දැ? යි ෆිර්අවුන් විමසීය.

قَالَ رَبُّ السَّمَاوَاتِ وَالْأَرْضِ وَمَا بَيْنَهُمَا ۖ إِنْ كُنْتُمْ مُوقِنِينَ {24}

නුඹලා තරයේ විශ්වාස කරන්නන් ලෙස සිටියෙහු නම් (දැන ගනු) අහස් හි හා මහපොළවෙහි ද ඒ දෙක අතර ඇති දෑහි ද පරමාධිපති (ඔහු)ය යැයි ඔහු (මූසා) පැවසීය.

قَالَ لِمَنْ حَوْلَهُ أَلَا تَسْتَمِعُونَ {25}

නුඹලා සවන් නොදෙන්නේ දැයි අවට සිටියවුන්ගෙන් ඔහු (ෆිර්අවුන්) පැවසීය.

قَالَ رَبُّكُمْ وَرَبُّ آبَائِكُمُ الْأَوَّلِينَ {26}

(ඔහු) නුඹලාගේ පරමාධිපති ද නුඹලාගේ මුල් මුතුන් මිත්තන්ගේ පරමාධිපති ද වේ යැයි (මූසා) පැවසීය.

قَالَ إِنَّ رَسُولَكُمُ الَّذِي أُرْسِلَ إِلَيْكُمْ لَمَجْنُونٌ {27}

නුඹලා වෙත එවනු ලැබූ නුඹලාගේ දහම් දූතයා නියත වශයෙන්ම උම්මත්තකයෙකි යැයි ඔහු (ෆර්අවුන්) පැවසීය.

قَالَ رَبُّ الْمَشْرِقِ وَالْمَغْرِبِ وَمَا بَيْنَهُمَا ۖ إِنْ كُنْتُمْ تَعْقِلُونَ {28}

නුඹලා වටහා ගන්නන් ලෙස සිටියෙහු නම් (දැන ගනු) නැගෙනහිර බටහිර හා ඒ දෙක අතර ඇති දෑහි හිමිපාණන් (ඔහු)ය යැයි ඔහු (මූසා) පැවසීය.

قَالَ لَئِنِ اتَّخَذْتَ إِلَٰهًا غَيْرِي لَأَجْعَلَنَّكَ مِنَ الْمَسْجُونِينَ {29}

මා හැර වෙනත් දෙවියකු නුඹ ගත්තෙහි නම් සැබැවින්ම මම නුඹ ව සිරකරුවන් අතරට පත් කරමි යැයි ඔහු (ෆිර්අවුන්) පැවසීය.

قَالَ أَوَلَوْ جِئْتُكَ بِشَيْءٍ
مُبِينٍ {30}

මම නුඹ වෙත පැහැදිලි කරුණක් ගෙන අවේ නම් වුව) දැයි ඔහු (මූසා) විමසීය.

قَالَ فَأْتِ بِهِ إِنْ كُنْتَ مِنَ
الصَّادِقِينَ {31}

එසේ නම් නුඹ සත්‍යවාදීන් අතුරින් නම් එය නුඹ ගෙන එනු යැයි ඔහු (ෆිර්අවුන්) පැවසීය.

فَأَلْقَىٰ عَصَاهُ فَإِذَا هِيَ ثُعْبَانٌ
مُبِينٌ {32}

එවිට ඔහු (මූසා) ඔහුගේ සැරයටිය (බිම) හෙළුවේය. එවිට එය පැහැදිලි නාගයකු විය.

وَنَزَعَ يَدَهُ فَإِذَا هِيَ بَيْضَاءُ
لِلنَّاظِرِينَ {33}

තවද ඔහුගේ අත ඉවතට ගත්තේය. එවිට එය නරඹන්නන් හට (දීප්තියෙන් බැබළෙන) සුදුවන් (සේ දිස්) විය.

قَالَ لِلْمَلَإِ حَوْلَهُ إِنَّ هَٰذَا لَسَاحِرٌ
عَلِيمٌ {34}

නියත වශයෙන්ම මොහු මනා දැනුමැති හූනියම් කරවෙකි යැයි තමන් අවට සිටි ප්‍රධානීන් හට ඔහු පැවසීය.

يُرِيدُ أَنْ يُخْرِجَكُمْ مِنْ أَرْضِكُمْ
بِسِحْرِهِ فَمَاذَا تَأْمُرُونَ {35}

ඔහුගේ හූනියම මගින් නුඹලා ව නුඹලාගේ දේශයෙන් පිටුවහල් කිරීමට ඔහු අපේක්ෂා කරයි. එහෙයින් (ඔහු ගැන මට) නුඹලා කුමක් අණ කරන්නෙහු ද?

قَالُوا أَرْجِهْ وَأَخَاهُ وَابْعَثْ فِي
الْمَدَائِنِ حَاشِرِينَ {36}

ඔහු හා ඔහුගේ සහෝදරයාට කල් දෙනු. තවද නගරවලට (ජනයා) එක්රැස් කරන්නන් එවනු යැයි ඔවුහු (ප්‍රධානීහු) පැවසුවෝය.

يَأْتُوكَ بِكُلِّ سَحَّارٍ
عَلِيمٍ {37}

මනා දැනුමැති සියලුම හූනියම්කරුවන් නුඹ වෙත ඔවුහු ගෙන එනු ඇත.

فَجُمِعَ السَّحَرَةُ لِمِيقَاتِ يَوْمٍ مَعْلُومٍ {38}

එසේ නියමිත දිනක නියමිත වේලාවක හූනියම් කරුවන් එක්රැස් කරන ලදී.

وَقِيلَ لِلنَّاسِ هَلْ أَنْتُمْ مُجْتَمِعُونَ {39}

තවද නුඹලා ද එක්රැස්වන්නෝ දැයි ජනයාගෙන් විමසන ලදී.

لَعَلَّنَا نَتَّبِعُ السَّحَرَةَ إِنْ كَانُوا هُمُ الْغَالِبِينَ {40}

හූනියම් කරුවන් වන ඔවුහු අබිබවා යන්නන් වූයෙහු නම් අපට ඔවුන් පිළිපැදිය හැකි වනු ඇත.

فَلَمَّا جَاءَ السَّحَرَةُ قَالُوا لِفِرْعَوْنَ أَئِنَّ لَنَا لَأَجْرًا إِنْ كُنَّا نَحْنُ الْغَالِبِينَ {41}

හූනියම්කරුවෝ පැමිණි කල්හි අප අබිබවා යන්නන් වූයේ නම් අපට කුලියක් තිබේ දැයි ඔවුහු ෆිර්අවුන්ගෙන් විමසූහ.

قَالَ نَعَمْ وَإِنَّكُمْ إِذًا لَمِنَ الْمُقَرَّبِينَ {42}

එසේය: එවිට නියත වශයෙන්ම නුඹලා (මට) සමීපතයින් අතුරින් වන්නෙහුය.

قَالَ لَهُمْ مُوسَىٰ أَلْقُوا مَا أَنْتُمْ مُلْقُونَ {43}

නුඹලා හෙළන දෑ හෙළනු යැයි මූසා ඔවුනට පැවසීය.

فَأَلْقَوْا حِبَالَهُمْ وَعِصِيَّهُمْ وَقَالُوا بِعِزَّةِ فِرْعَوْنَ إِنَّا لَنَحْنُ الْغَالِبُونَ {44}

එවිට ඔවුහු ඔවුන්ගේ ලණු හා ඔවුන්ගේ යෂ්ටි හෙළූහ. තවද ෆිර්අවුන්ගේ අනුහසින් නියත වශයෙන්ම අබිබවා යන්නෝ අපමය යැයි ඔවුහු පැවසූහ.

فَأَلْقَىٰ مُوسَىٰ عَصَاهُ فَإِذَا هِيَ تَلْقَفُ مَا يَأْفِكُونَ {45}

එවිට මූසා ඔහුගේ සැරයටිය හෙළීය. එවිට එය ඔවුන් මවා පාන දෑ ගිල ගත්තේය.

පසුව හූනියම්කරුවන් සිරස නමා නමස්කාර කරන්නන් බවට පත් කර දමන ලදී.	فَأُلْقِيَ السَّحَرَةُ سَاجِدِينَ {46}
මූසාගේ හා හාරූන්ගේ පරමාධිපති වන සර්ව ලෝකයන්හි පරමාධිපතියාණන් ගැන අපි විශ්වාස කළෙමු යැයි ඔවුහු පැවසූහ.	قَالُوا آمَنَّا بِرَبِّ الْعَالَمِينَ {47} رَبِّ مُوسَىٰ وَهَارُونَ {48}
මම නුඹලාට අවසර දීමට පෙර නුඹලා ඔහු විශ්වාස කළෙහු ද?. නුඹලාට හූනියම ඉගැන් වූ ඔහු නුඹලාගේ ප්‍රධානියා වී ඇත. එහෙයින් නුඹලා මතු දැන ගනු ඇත. නියත වශයෙන්ම නුඹලාගේ අත් හා නුඹලාගේ පාද මාරුවෙන් මාරුවට මම කපා දමමි. තවද මම නුඹලා සියල්ල කුරිසියේ දමා ඇණ ගසමි. යැයි පැවසීය.	قَالَ آمَنْتُمْ لَهُ قَبْلَ أَنْ آذَنَ لَكُمْ ۖ إِنَّهُ لَكَبِيرُكُمُ الَّذِي عَلَّمَكُمُ السِّحْرَ فَلَسَوْفَ تَعْلَمُونَ ۚ لَأُقَطِّعَنَّ أَيْدِيَكُمْ وَأَرْجُلَكُمْ مِنْ خِلَافٍ وَلَأُصَلِّبَنَّكُمْ أَجْمَعِينَ {49}
කිසිදු ප්‍රශ්නයක් නොමැත. නියත වශයෙන්ම අපි අපගේ පරමාධිපතියාණන් වෙත හැරෙන්නන් වෙමු යැයි ඔවුහු පැවසූහ.	قَالُوا لَا ضَيْرَ ۖ إِنَّا إِلَىٰ رَبِّنَا مُنْقَلِبُونَ {50}
අප දෙවියන් කෙරෙහි විශ්වාස තැබූ මුල් අය වූ බැවින් අපගේ වැරදි වලට අපගේ පරමාධිපති අපට සමාව දෙනු ඇතැයි නියත වශයෙන්ම අපි ප්‍රිය කරන්නෙමු.	إِنَّا نَطْمَعُ أَنْ يَغْفِرَ لَنَا رَبُّنَا خَطَايَانَا أَنْ كُنَّا أَوَّلَ الْمُؤْمِنِينَ {51}

52-68. මූසා (අලයිහිස් සලාම්) තුමා හා ඔහු සමග වූ විශ්වාසවන්තයින් ආරක්ෂා වී හා ෆිර්අවුන් ඇතුළු ඔහුගේ සේනාව දියේ ගිලී යෑම.

وَأَوْحَيْنَا إِلَىٰ مُوسَىٰ أَنْ أَسْرِ بِعِبَادِي إِنَّكُمْ مُتَّبَعُونَ {52}

තවද මාගේ ගැත්තන් රැගෙන නුඹ රාත්‍රියේ පිටත් ව යනු. නියත වශයෙන්ම නුඹලා ලුහුබඳිනු ලබන්නන් යැයි මූසා වෙත අපි දේව පණිවිඩ එව්වෙමු.

فَأَرْسَلَ فِرْعَوْنُ فِي الْمَدَائِنِ حَاشِرِينَ {53}

එවිට ෆිර්අවුන් (මොවුන් ගැන නිවේදනය කරනු වස්) නගර වලට රැස් කරන්නන් එවීය.

إِنَّ هَٰؤُلَاءِ لَشِرْذِمَةٌ قَلِيلُونَ {54}

නියත වශයෙන්ම මොවුන් (මූසාගේ පිරිස) ස්වල්ප පිරිසක් පමණි.

وَإِنَّهُمْ لَنَا لَغَائِظُونَ {55}

තවද නියත වශයෙන්ම මොවුහු අපට කෝපය ඇති කළවුන් වෙති.

وَإِنَّا لَجَمِيعٌ حَاذِرُونَ {56}

තවද නියත වශයෙන්ම අප සියලු දෙනා අවදියෙන් සිටිය යුත්තෝ වෙමු.

فَأَخْرَجْنَاهُمْ مِنْ جَنَّاتٍ وَعُيُونٍ {57} وَكُنُوزٍ وَمَقَامٍ كَرِيمٍ {58}

එහෙයින් ඔවුන් (භුක්ති විඳිමින් සිටි) උයන් වලින් හා උල්පත් වලින් ද නිධන් වලින් හා ගෞරවනීය ස්ථානයෙන් ද අපි ඔවුන් බැහැර කළෙමු.

كَذَٰلِكَ وَأَوْرَثْنَاهَا بَنِي إِسْرَائِيلَ {59}

එලෙස අපි එ(ම සම්පත්වලින් පිරුණු දේශ)ය ඉස්රාඊල් දරුවන්ට උරුම කර දුන්නෙමු.

فَأَتْبَعُوهُمْ مُشْرِقِينَ {60}

පසුව උදැසන උදාවූවන් ලෙසින් ඔවුහු ඔවුන් ලුහු බැන්දෝය.

فَلَمَّا تَرَاءَى الْجَمْعَانِ قَالَ أَصْحَابُ مُوسَىٰ إِنَّا

කණ්ඩායම් දෙක එකිනෙකා දුටු කල්හි, නියත වශයෙන්ම අපි කොටු කරනු ලබන්නන් වූයෙමු යැයි

لَمُدْرَكُونَ {61}

මූසාගේ සගයෝ පැවසූහ.

قَالَ كَلَّا ۖ إِنَّ مَعِيَ رَبِّي سَيَهْدِينِ {62}

එසේ නොව නියත වශයෙන්ම මා සමග මාගේ පරමාධිපති සිටියි. ඔහු මට මග පෙන්වනු ඇතැයි ඔහු පැවසීය.

فَأَوْحَيْنَا إِلَىٰ مُوسَىٰ أَنِ اضْرِبْ بِعَصَاكَ الْبَحْرَ ۖ فَانْفَلَقَ فَكَانَ كُلُّ فِرْقٍ كَالطَّوْدِ الْعَظِيمِ {63}

ඔබේ සැරයටියෙන් මුහුදට ගසන මෙන් අපි මූසාට දන්වා සිටියෙමු. එවිට එය පැළී ගියේය. (පැළී ගිය) සෑම කොටසක්ම මහා කඳු මෙන් (ජලකඳ ඉහළට එස)විය.

وَأَزْلَفْنَا ثَمَّ الْآخَرِينَ {64}

තවද අපි එහි (ෆිර්අවුන්ගේ සේනාව වූ) අනෙක් අයද සමීප කළෙමු.

وَأَنْجَيْنَا مُوسَىٰ وَمَنْ مَعَهُ أَجْمَعِينَ {65}

තවද අපි මූසා හා ඔහු සමග සිටි සියලු දෙනා මුදවා ගත්තෙමු.

ثُمَّ أَغْرَقْنَا الْآخَرِينَ {66}

පසුව අපි අනෙක් අය දියේ ගිල්වීමු.

إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {67}

නියත වශයෙන්ම එහි සංඥාවක් විය. තවද ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.

وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {68}

තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපති වන ඔහුමය සර්ව බලධාරියාණන් මහා කරුණාන්විතයාණන්.

69-89. ඉබ්‍රාහීම් (අලයිහිස් සලාම්) තුමා තම පියාණන් හා තම සමූහයා අතර වූ සාකච්ඡා

وَاتْلُ عَلَيْهِمْ نَبَأَ إِبْرَاهِيمَ {69}

තවද නුඹ ඔවුන් වෙත ඉබ්‍රාහීම්ගේ පුවත කියවා පෙන්වනු.

إِذْ قَالَ لِأَبِيهِ وَقَوْمِهِ مَا تَعْبُدُونَ {70}

නුඹලා කුමක් නමදින්නෙහුදැයි ඔහු තම පියාණන් හා තම ජනයාගෙන් විමසීය.

قَالُوا نَعْبُدُ أَصْنَامًا فَنَظَلُّ لَهَا عَاكِفِينَ {71}

අපි පිළිම නමදින්නෙමු. එහෙයින් ඒ වෙනුවෙන්ම අපි රැඳී සිටින්නන් වෙමු යැයි ඔවුහු පැවසූහ.

قَالَ هَلْ يَسْمَعُونَكُمْ إِذْ تَدْعُونَ {72} أَوْ يَنْفَعُونَكُمْ أَوْ يَضُرُّونَ {73}

නුඹලා අමතන විට නුඹලාට ඔවුන් සවන් දෙන්නේ ද? එසේ නැතහොත්, ඔවුන් නුඹලාට සෙත සළසන්නේ ද? එසේත් නැතහොත් ඔවුන් හිංසා පමුණුවන්නේ දැ?යි ඔහු විමසීය.

قَالُوا بَلْ وَجَدْنَا آبَاءَنَا كَذَٰلِكَ يَفْعَلُونَ {74}

නමුත් අපගේ මුතුන් මිත්තන් එසේ සිදුකරනු අපි දැක ඇත්තෙමුයි ඔවුහු පැවසූහ.

قَالَ أَفَرَأَيْتُمْ مَا كُنْتُمْ تَعْبُدُونَ {75} أَنْتُمْ وَآبَاؤُكُمُ الْأَقْدَمُونَ {76}

නුඹලා හා නුඹලාගේ මුල් මුතුන් මිත්තන් නමදිමින් සිටින දෑ ගැන නුඹලා සිතා බැලුවෙහු දැ?යි ඔහු (ඉබ්‍රාහිම්) විමසීය.

فَإِنَّهُمْ عَدُوٌّ لِي إِلَّا رَبَّ الْعَالَمِينَ {77}

හේතුව සර්ව ලෝකයන්හි පරමාධිපති(අල්ලාහ්) හැර ඔවුන් (සියලු දෙනා) මාගේ සතුරන් වන බැවිනි.

الَّذِي خَلَقَنِي فَهُوَ يَهْدِينِ {78}

ඔහු(අල්ලාහ්) වනාහි මා මවා මට මග පෙන්වයි.

وَالَّذِي هُوَ يُطْعِمُنِي وَيَسْقِينِ {79}

තවද ඔහු වනාහි මට ආහාර සපයයි. මට පානය දෙයි.

وَإِذَا مَرِضْتُ فَهُوَ يَشْفِينِ {80}	තවද මා රෝගී වූ විට ඔහු මට සුවය දෙයි.
وَالَّذِي يُمِيتُنِي ثُمَّ يُحْيِينِ {81}	තවද ඔහු වනාහි මා මරණයට පත් කොට පසුව මට (යළි) ජීවිය දෙයි.
وَالَّذِي أَطْمَعُ أَنْ يَغْفِرَ لِي خَطِيئَتِي يَوْمَ الدِّينِ {82}	තවද ඔහු වනාහි මාගේ වැරදි වලට විනිශ්චය දිනයේ දී මට සමාව දෙනු අතැයි මම ආශා කරන්නෙමි.
رَبِّ هَبْ لِي حُكْمًا وَأَلْحِقْنِي بِالصَّالِحِينَ {83}	මාගේ පරමාධිපතියාණනි, මට ප්‍රඥාව පිරිනමනු මැනව ! තවද මා දැහැමියන් සමඟ එක් කරනු මැනව!
وَاجْعَلْ لِي لِسَانَ صِدْقٍ فِي الْآخِرِينَ {84}	තවද පසු ව පැමිණෙන්නන් අතර සැබෑ ලෙස අගයන කතාවක් බවට මා පත් කරනු මැනව !
وَاجْعَلْنِي مِنْ وَرَثَةِ جَنَّةِ النَّعِيمِ {85}	සුව පහසුකම් ඇති ස්වර්ගයේ උරුමක්කරුවන් අතුරින් මා පත් කරනු මැනව !
وَاغْفِرْ لِأَبِي إِنَّهُ كَانَ مِنَ الضَّالِّينَ {86}	තවද මාගේ පියාණන්ට සමාව දෙනු මැනව ! නියත වශයෙන්ම ඔහු මුළා වූවන් අතුරින් කෙනෙකු විය.
وَلَا تُخْزِنِي يَوْمَ يُبْعَثُونَ {87}	(ජනයා) මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින නුඹ මා දුකට පත් නොකරනු මැනව !
يَوْمَ لَا يَنْفَعُ مَالٌ وَلَا بَنُونَ {88}	(එය) ධනය හා දරුවන් ප්‍රයෝජනවත් නොවන දිනකි.
إِلَّا مَنْ أَتَى اللَّهَ بِقَلْبٍ سَلِيمٍ {89}	නමුත් ශාන්තමය හදවතකින් අල්ලාහ් වෙත පැමිණෙන්නන් හැර.

90-104. මළවුන් නැගිටුවනු ලබන දිනයේ ඇතැම් සිදුවීම්. එදින නිරයේ සිටින ඇතැමෙකු ඇතැමෙකුට දොස් නැගීම.

බිය බැතිමතුන් හට ස්වර්ගය සමීප කරවනු ලැබේ.	وَأُزْلِفَتِ الْجَنَّةُ لِلْمُتَّقِينَ {90}
තවද සීමාව ඉක්මවා ගියවුන්ට නිරය හෙළි කරනු ලැබේ.	وَبُرِّزَتِ الْجَحِيمُ لِلْغَاوِينَ {91}
අල්ලාහ්ගෙන් තොර නුඹලා නමදිමින් සිටි දෑ කොහේදැ?යි ඔවුන්ගෙන් විමසනු ලැබේ. ඔවුහු නුඹලාට උදව් කරන්නෝ ද? එසේ නැතිහොත් ඔවුහු උදව් ලබන්නෝද?	وَقِيلَ لَهُمْ أَيْنَ مَا كُنْتُمْ تَعْبُدُونَ {92} مِنْ دُونِ اللَّهِ هَلْ يَنْصُرُونَكُمْ أَوْ يَنْتَصِرُونَ {93}
එවිට ඔවුන ් සීමාව ඉක්මවූවන් හා ඉබ්ලීස්ගේ සේනාව යන සියලු දෙනා මුණින් අතට හෙළනු ලැබේ.	فَكُبْكِبُوا فِيهَا هُمْ وَالْغَاوُونَ {94} وَجُنُودُ إِبْلِيسَ أَجْمَعُونَ {95}
තවද ඔවුහු එහි වාද කර ගනිමින් මෙසේ පවසති.	قَالُوا وَهُمْ فِيهَا يَخْتَصِمُونَ {96}
සර්ව ලෝකයන්හි පරමාධිපතිට සමානයන් ලෙස අපි නුඹලා ව පත් කළ අවස්ථාවේ අල්ලාහ් මත දිවුරමින් නියත වශයෙන්ම අපි පැහැදිලි නොමගෙහි වූයෙමු.	تَاللَّهِ إِنْ كُنَّا لَفِي ضَلَالٍ مُبِينٍ {97} إِذْ نُسَوِّيكُمْ بِرَبِّ الْعَالَمِينَ {98}
අපරාධකරුවෝ මිස වෙනත් කිසිවකු අප ව නොමග නොයැවීය.	وَمَا أَضَلَّنَا إِلَّا الْمُجْرِمُونَ {99}

فَمَا لَنَا مِنْ شَافِعِينَ {100}
وَلَا صَدِيقٍ حَمِيمٍ {101}

එහෙයින් අප වෙනුවෙන් මැදිහත්වන්නන් කිසිවකු හෝ උණුවන (හදවතක් ඇති) මිතුරෙකු හෝ නොමැත.

فَلَوْ أَنَّ لَنَا كَرَّةً فَنَكُونَ مِنَ الْمُؤْمِنِينَ {102}

එහෙයින් අපහට තවත් වාරයක් වී නම් එවිට අපි දෙවියන් විශ්වාස කරන්නන් අතුරින් වන්නෙමු.

إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {103}

නියත වශයෙන්ම එහි සංඥාවක් ඇත. එහෙත්, ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.

وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {104}

තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය සර්ව බලධාරී මහාකරුණාන්විත යාණන්.

105-122. නූහ් නබි (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ قَوْمُ نُوحٍ الْمُرْسَلِينَ {105}

නූහ්ගේ ජනයා දූතවරුන් බොරු කළහ.

إِذْ قَالَ لَهُمْ أَخُوهُمْ نُوحٌ أَلَا تَتَّقُونَ {106}

නුඹලා බිය බැතිමත් විය යුතු නොවේදැයි ඔවුන්ගේ සහෝදර නූහ් ඔවුනට පැවසූ අවස්ථාවේ..

إِنِّي لَكُمْ رَسُولٌ أَمِينٌ {107}

නියත වශයෙන්ම මම නුඹලා සඳහා වූ විශ්වාසනීය දූතයකි.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {108}

එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.

وَمَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ ۖ

තවද ඒ වෙනුවෙන් මම කිසිදු කුලියක් නුඹලාගෙන් නොඉල්ලමි.

إِنْ أَجْرِيَ إِلَّا عَلَىٰ رَبِّ
الْعَالَمِينَ {109}

මාගේ කුලිය සර්ව ලෝකයන්හි
පරමාධිපතියාණන් වෙත මිස නැත.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {110}

එහෙයින් නුඹලා අල්ලාහ්ට
බැතිමත් වනු. තවද නුඹලා මට
අවනත වනු.

قَالُوا أَنُؤْمِنُ لَكَ وَاتَّبَعَكَ
الْأَرْذَلُونَ {111}

පහත් අය නුඹ ව අනුගමනය
කරමින් සිටියදී අපි නුඹ ව විශ්වාස
කරන්නෙම් දැයි ඔවුහු විමසූහ.

قَالَ وَمَا عِلْمِي بِمَا كَانُوا
يَعْمَلُونَ {112}

ඔවුන් සිදු කරමින් සිටි දෑ පිළිබඳ ව
මට දැනුම නොමැතැයි ඔහු
පැවසුවේය.

إِنْ حِسَابُهُمْ إِلَّا عَلَىٰ رَبِّي ۖ لَوْ
تَشْعُرُونَ {113}

නුඹලා වටහා ගන්නේ නම්
ඔවුන්ගේ ගිණුම ද මාගේ
පරමාධිපති මත මිස නැත.

وَمَا أَنَا بِطَارِدِ
الْمُؤْمِنِينَ {114}

තවද මම දෙවියන් කෙරෙහි
විශ්වාස කරන්නන් පලවා
හරින්නෙකු නොවෙමි.

إِنْ أَنَا إِلَّا نَذِيرٌ مُبِينٌ {115}

මම පැහැදිලි අවවාද කරන්නෙකු
මිස නැත.

قَالُوا لَئِنْ لَمْ تَنْتَهِ يَا نُوحُ لَتَكُونَنَّ
مِنَ الْمَرْجُومِينَ {116}

අහෝ ! නූහ්, නුඹ මෙයින්
නොවැළකුණෙහි නම් සැබැවින්ම
නුඹ ගල් ගසනු ලබන්නන් අතුරින්
වනු ඇතැයි ඔවුහු පැවසූහ.

قَالَ رَبِّ إِنَّ قَوْمِي
كَذَّبُونِ {117}

මාගේ පරමාධිපතියාණනි, නියත
වශයෙන්ම මාගේ ජනයා මා බොරු
කළහ යැයි ඔහු පැවසීය.

فَافْتَحْ بَيْنِي وَبَيْنَهُمْ فَتْحًا وَنَجِّنِي

එහෙයින් මා අතර හා ඔවුන් අතර
විවෘත තීන්දුවක් දෙනු මැනව! තවද

وَمَنْ مَعِيَ مِنَ الْمُؤْمِنِينَ {118}	මා ද මා සමග සිටින්නවුන් අතුරින් දෙවියන් කෙරෙහි විශ්වාස කරන්නන් ද නුඹ මුදවා ගනු මැනව!
فَأَنْجَيْنَاهُ وَمَنْ مَعَهُ فِي الْفُلْكِ الْمَشْحُونِ {119}	එවිට (ජීවීන්) පටවනු ලැබූ නැවෙහි සිටි ඔහු ද ඔහු සමග සිටියවුන් ද අපි මුදවා ගත්තෙමු.
ثُمَّ أَغْرَقْنَا بَعْدُ الْبَاقِينَ {120}	ඉන් අනතුරු ව අපි ඉතිරිවූවන් (දියෙහි) ගිල්වූයෙමු.
إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {121}	නියත වශයෙන්ම එහි සංඥාවක් ඇත. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.
وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {122}	තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය සර්ව බලධාරී මහාකරුණාන්විත යාණන්.

123-140. හූද් නබි (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ عَادٌ الْمُرْسَلِينَ {123}	ආද් ජනයා ද දහම් දූතයින් බොරු කළහ.
إِذْ قَالَ لَهُمْ أَخُوهُمْ هُودٌ أَلَا تَتَّقُونَ {124}	නුඹලා බිය බැතිමත් විය යුතු නොවේ දැයි ඔවුන්ගේ සහෝදර සාලිහ් ඔවුනට පැවසූ අවස්ථාව සිහියට නගනු.
إِنِّي لَكُمْ رَسُولٌ أَمِينٌ {125}	නියත වශයෙන්ම මම නුඹලා වෙනුවෙන් වූ විශ්වාසනීය දූතයකි.
فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {126}	එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.

وَمَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ ۖ إِنْ أَجْرِيَ إِلَّا عَلَىٰ رَبِّ الْعَالَمِينَ {127}

තවද ඒ වෙනුවෙන් මම කිසිදු කුලියක් නුඹලාගෙන් නොඉල්ලමි. මාගේ කුලිය සර්ව ලෝකයන්හි පරමාධිපතියාණන් වෙත මිස නැත.

أَتَبْنُونَ بِكُلِّ رِيعٍ آيَةً تَعْبَثُونَ {128}

සෑම උස් තැනකම නුඹලා විනෝදය පිණිස සංඥා (කුලුනු) තනන්නෙහු ද?

وَتَتَّخِذُونَ مَصَانِعَ لَعَلَّكُمْ تَخْلُدُونَ {129}

නුඹලා සදා ජීවත් විය හැකි වනු පිණිස මන්දිර තනා ගන්නෙහු ද?

وَإِذَا بَطَشْتُمْ بَطَشْتُمْ جَبَّارِينَ {130}

තවද නුඹලා (කිසිවකු) හසු කළ විට දැඩි පාලකයින් ලෙසින් නුඹලා හසු කර ගන්නෙහුය.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {131}

එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.

وَاتَّقُوا الَّذِي أَمَدَّكُمْ بِمَا تَعْلَمُونَ {132}

නුඹලා දන්නා දෑ මගින් නුඹලාට උපකාර කළ ඔහුට නුඹලා බිය බැතිමත් වනු.

أَمَدَّكُمْ بِأَنْعَامٍ وَبَنِينَ {133} وَجَنَّاتٍ وَعُيُونٍ {134}

ගොවිපළ සතුන් පිරිමි දරුවන් උයන් හා උල්පත් මගින් ඔහු නුඹලාට උපකාර කළේය.

إِنِّي أَخَافُ عَلَيْكُمْ عَذَابَ يَوْمٍ عَظِيمٍ {135}

නියත වශයෙන්ම මම නුඹලා කෙරෙහි මහත් දිනයක දඬුවම ගැන බිය වෙමි.

قَالُوا سَوَاءٌ عَلَيْنَا أَوَعَظْتَ أَمْ لَمْ

නුඹ උපදෙස් කළ ද එසේ නැතහොත් නුඹ උපදෙස්

تَكُنْ مِنَ الْوَاعِظِينَ {136}	කරන්නන් අතුරින් නොවූව ද අප වෙත එක සමානය යැයි ඔවුහු පැවසූහ.
إِنْ هَٰذَا إِلَّا خُلُقُ الْأَوَّلِينَ {137}	මෙය මුතුන් මිත්තන්ගේ ගති පැවතුම් මිස වෙනෙකක් නොවීය.
وَمَا نَحْنُ بِمُعَذَّبِينَ {138}	තවද අපි දඬුවම් කරනු ලබන්නන් නොවූයෙමු.
فَكَذَّبُوهُ فَأَهْلَكْنَاهُمْ ۗ إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {139}	එසේ ඔවුහු බොරු කළෝය. එහෙයින් අපි ඔවුන් විනාශ කළෙමු. නියත වශයෙන්ම එහි සංඥාවක් විය. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.
وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {140}	තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය මහාකරුණාන්විත සර්ව බලධාරීයාණන්.

141-159. සාලිහ් නබි (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ ثَمُودُ الْمُرْسَلِينَ {141}	සමූද් ජනයා ද දහම් දූතයින් බොරු කළහ.
إِذْ قَالَ لَهُمْ أَخُوهُمْ صَالِحٌ أَلَا تَتَّقُونَ {142}	නුඹලා බිය බැතිමත් විය යුතු නොවේ දැ?යි ඔවුන්ගේ සහෝදර සාලිහ් ඔවුනට පැවසූ අවස්ථාව සිහියට නගනු.
إِنِّي لَكُمْ رَسُولٌ أَمِينٌ {143}	නියත වශයෙන්ම මම නුඹලා වෙනුවෙන් වූ විශ්වාසනීය දූතයකු වෙමි.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {144}

එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.

وَمَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ ۖ إِنْ أَجْرِيَ إِلَّا عَلَىٰ رَبِّ الْعَالَمِينَ {145}

තවද ඒ වෙනුවෙන් මම කිසිදු කුලියක් නුඹලාගෙන් නොඉල්ලමි. මාගේ කුලිය සර්ව ලෝකයන්හි පරමාධිපතියාණන් වෙත මිස නැත.

أَتُتْرَكُونَ فِي مَا هَاهُنَا آمِنِينَ {146} فِي جَنَّاتٍ وَعُيُونٍ {147}

මෙහි උයන් හා උල්පත් වල ඇති දෑ සමග සුරක්ෂිතයින් ලෙස නුඹලා අතහැර දමනු ලබන්නෙහු ද?

وَزُرُوعٍ وَنَخْلٍ طَلْعُهَا هَضِيمٌ {148}

තවද කෙත් වතු හා පැහුණු වලුබරැති ඉඳි ගස්හි ද

وَتَنْحِتُونَ مِنَ الْجِبَالِ بُيُوتًا فَارِهِينَ {149}

තවද නුඹලා දක්ෂ ලෙසින් කඳු තුළ හාරා නිවෙස් තනා ගන්නෙහුය.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {150}

එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.

وَلَا تُطِيعُوا أَمْرَ الْمُسْرِفِينَ {151}

තවද නුඹලා සීමාව ඉක්මවූවන්ගේ නියෝගයට අවනත නොවනු.

الَّذِينَ يُفْسِدُونَ فِي الْأَرْضِ وَلَا يُصْلِحُونَ {152}

ඔවුහු වනාහි මහපොළොවේ කලහකම් කරන්නෝ වෙති. තවද ඔවුහු විධිමත් ව කටයුතු නොකරති.

قَالُوا إِنَّمَا أَنْتَ مِنَ

නියත වශයෙන්ම නුඹ හූනියම් කරනු ලැබූවන් අතුරින් කෙනෙකු

الْمُسَحَّرِينَ {153}

යැයි ඔවුහු පැවසූහ.

مَا أَنْتَ إِلَّا بَشَرٌ مِثْلُنَا فَأْتِ بِآيَةٍ إِنْ كُنْتَ مِنَ الصَّادِقِينَ {154}

නුඹ අප මෙන් මිනිසෙකු මිස නැත. එහෙයින් නුඹ සත්‍යවාදීන් අතුරින් නම් සංඥාවක් ගෙන එනු.

قَالَ هَٰذِهِ نَاقَةٌ لَهَا شِرْبٌ وَلَكُمْ شِرْبُ يَوْمٍ مَعْلُومٍ {155}

මෙය ඔටු දෙනයි. ඇය වෙනුවෙන් පානය (සඳහා වූ දිනය)කි. තවද නුඹලා වෙනුවෙන් පානය සඳහා නම් කරනු ලැබූ දිනයකි.

وَلَا تَمَسُّوهَا بِسُوءٍ فَيَأْخُذَكُمْ عَذَابُ يَوْمٍ عَظِيمٍ {156}

තවද නුඹලා නපුරු අයුරින් උෟ ස්පර්ශ නොකරනු. එවිට මහත් දිනයක දඬුවම නුඹලා ග්‍රහණය කරනු ඇත.

فَعَقَرُوهَا فَأَصْبَحُوا نَادِمِينَ {157}

නමුත් ඔවුහු උගේ නහර කපා මරා දැමූහ. එවිට ඔවුහු වැලපෙන්නන් බවට පත් වූහ.

فَأَخَذَهُمُ الْعَذَابُ ۗ إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {158}

එවිට එම දඬුවම ඔවුහු ග්‍රහණය කළෝය. නියත වශයෙන්ම එහි සංඥාවක් විය. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් කෙරෙහි විශ්වාස කරන්නන් නොවූහ.

وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {159}

තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය සර්ව බලධාරී මහාකරුණාන්විතයාණන්.

160-175. ලූත් නබි (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ قَوْمُ لُوطٍ

ලූත්ගේ ජනයා ද දහම් දූතයින් බොරු කළහ.

الْمُرْسَلِينَ {160}	
إِذْ قَالَ لَهُمْ أَخُوهُمْ لُوطٌ أَلَا تَتَّقُونَ {161}	නුඹලා බිය බැතිමත් විය යුතු නොවේදැයි ඔවුන්ගේ සහෝදර ලූත් ඔවුනට පැවසූ අවස්ථාව සිහියට නගනු.
إِنِّي لَكُمْ رَسُولٌ أَمِينٌ {162}	නියත වශයෙන්ම මම නුඹලා වෙත (එවනු ලැබුවා) වූ විශ්වාසනීය දූතයකු වෙමි.
فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {163}	එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද නුඹලා මට අවනත වනු.
وَمَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ ۖ إِنْ أَجْرِيَ إِلَّا عَلَىٰ رَبِّ الْعَالَمِينَ {164}	තවද ඒ වෙනුවෙන් මම කිසිදු කුලියක් නුඹලාගෙන් නොඉල්ලමි. මාගේ කුලිය සර්ව ලෝකයන්හි පරමාධිපතියාණන් වෙත මිස නැත.
أَتَأْتُونَ الذُّكْرَانَ مِنَ الْعَالَمِينَ {165}	නුඹලා ලෝවැසියන් අතුරින් පිරිමින් වෙත (සම ලිංගික අවශ්‍යතා සඳහා) යන්නෙහු ද?
وَتَذَرُونَ مَا خَلَقَ لَكُمْ رَبُّكُمْ مِنْ أَزْوَاجِكُمْ ۚ بَلْ أَنْتُمْ قَوْمٌ عَادُونَ {166}	නුඹලාගේ බිරියන් අතුරින් නුඹලාගේ පරමාධිපති නුඹලා වෙනුවෙන් මැවූ දෑ අත හැර දමා (පිරිමින් වෙත) යන්නෙහුය. නමුත් නුඹලා සීමාව ඉක්මවා ගිය පිරිසකි.
قَالُوا لَئِنْ لَمْ تَنْتَهِ يَا لُوطُ لَتَكُونَنَّ مِنَ الْمُخْرَجِينَ {167}	අහෝ ලූත්! නුඹ එයින් නොවැළකුණෙහි නම්, සැබැවින්ම නුඹ බැහැර කරනු ලබන්නන් අතුරින් වන්නෙහුය යැයි ඔවුහු පැවසුවෝය.

قَالَ إِنِّي لِعَمَلِكُمْ مِنَ الْقَالِينَ {168}

නියත වශයෙන්ම මම නුඹලාගේ ක්‍රියාව පිළිකුල් කරන්නන් අතුරින් කෙනෙකු වෙමි යැයි ඔහු පැවසීය.

رَبِّ نَجِّنِي وَأَهْلِي مِمَّا يَعْمَلُونَ {169}

පරමාධිපතියාණනි, ඔවුන් සිදු කරන දැයින් මා හා මාගේ පවුල මුදවා ගනු මැනව!

فَنَجَّيْنَاهُ وَأَهْلَهُ أَجْمَعِينَ {170} إِلَّا عَجُوزًا فِي الْغَابِرِينَ {171}

එවිට රැඳී සිටියවුන් අතර වූ මැහැල්ලියක් හැර ඔහු හා ඔහුගේ දරුපවුලේ සෙසු සියලු දෙනා අපි මුදවා ගත්තෙමු.

ثُمَّ دَمَّرْنَا الْآخَرِينَ {172}

පසු ව අපි අනෙක් අය විනාශ කර දැමුවෙමු.

وَأَمْطَرْنَا عَلَيْهِمْ مَطَرًا ۖ فَسَاءَ مَطَرُ الْمُنْذَرِينَ {173}

තවද අපි ඔවුන් වෙත මහා වර්ෂාවක් පහළ කළෙමු. එවිට අවවාද කරනු ලැබූවන් සඳහා වූ වර්ෂාව දරුණු විය.

إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {174}

නියත වශයෙන්ම එහි සංඥාවක් විය. තවද ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.

وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {175}

තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය සර්ව බලධාරී මහාකරුණාන්විතයාණන්.

176-191. ෂුඅයිබ් නබි (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَ أَصْحَابُ الْأَيْكَةِ الْمُرْسَلِينَ {176}

අය්කා වාසීහු ද දහම් දූතයින් බොරු කළහ.

إِذْ قَالَ لَهُمْ شُعَيْبٌ أَلَا
تَتَّقُونَ {177}

නුඹලා බිය බැතිමත් විය යුතු
නොවේදැයි ෂුඅයිබ් ඔවුනට පැවසූ
අවස්ථාව සිහියට නගනු.

إِنِّي لَكُمْ رَسُولٌ أَمِينٌ {178}

නියත වශයෙන්ම මම නුඹලා
වෙනුවෙන් වූ විශ්වාසනීය දූතයකු
වෙමි.

فَاتَّقُوا اللَّهَ وَأَطِيعُونِ {179}

එහෙයින් නුඹලා අල්ලාහ්ට බිය
බැතිමත් වනු. තවද නුඹලා මට
අවනත වනු.

وَمَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ ۖ
إِنْ أَجْرِيَ إِلَّا عَلَىٰ رَبِّ
الْعَالَمِينَ {180}

තවද ඒ වෙනුවෙන් මම කිසිදු
කුලියක් නුඹලාගෙන් නොඉල්ලමි.
මාගේ කුලිය සර්ව ලෝකයන්හි
පරමාධිපතියාණන් වෙත මිස නැත.

أَوْفُوا الْكَيْلَ وَلَا تَكُونُوا مِنَ
الْمُخْسِرِينَ {181}

නුඹලා කිරුම් මිනුම් පූර්ණවත්
ලෙසින් ඉටු කරනු. තවද නුඹලා
පාඩු කරන්නන් අතුරින් නොවනු.

وَزِنُوا بِالْقِسْطَاسِ
الْمُسْتَقِيمِ {182}

සෘජු තුලනයෙන් නුඹලා කිරනු.

وَلَا تَبْخَسُوا النَّاسَ أَشْيَاءَهُمْ وَلَا
تَعْثَوْا فِي الْأَرْضِ
مُفْسِدِينَ {183}

තවද නුඹලා ජනයාට ඔවුන්ගේ
භාණ්ඩ වල අඩුපාඩු නොකරනු.
තවද නුඹලා මහපොළොවේ
කලහකාරීන් ලෙස සැරිනොසරනු.

وَاتَّقُوا الَّذِي خَلَقَكُمْ وَالْجِبِلَّةَ
الْأَوَّلِينَ {184}

නුඹලා හා මුල් මැවීම් මැවූ ඔහුට
නුඹලා බිය බැතිමත් වනු.

قَالُوا إِنَّمَا أَنْتَ مِنَ

නියත වශයෙන්ම නුඹ හූනියම්
කරනු ලැබූවන් අතුරිනි යැයි ඔවුහු

الْمُسَحَّرِينَ {185}	පැවසූහ.
وَمَا أَنْتَ إِلَّا بَشَرٌ مِثْلُنَا وَإِنْ نَظُنُّكَ لَمِنَ الْكَاذِبِينَ {186}	තවද නුඹ අප මෙන් මිනිසෙකු මිස නැත. තවද අපි නුඹ බොරුකාරයින් අතුරින් යැයි සිතමු.
فَأَسْقِطْ عَلَيْنَا كِسَفًا مِنَ السَّمَاءِ إِنْ كُنْتَ مِنَ الصَّادِقِينَ {187}	එසේ නම් නුඹ සත්‍යවාදීන් අතුරින් කෙනෙකු නම් අහසින් කැබැල්ලක් අප වෙත වැටෙන්නට සලස්වනු.
قَالَ رَبِّي أَعْلَمُ بِمَا تَعْمَلُونَ {188}	නුඹලා සිදු කරන දෑ පිළිබඳ ව මාගේ පරමාධිපති මැනවින් දන්නාය යැයි ඔහු පැවසීය.
فَكَذَّبُوهُ فَأَخَذَهُمْ عَذَابُ يَوْمِ الظُّلَّةِ ۚ إِنَّهُ كَانَ عَذَابَ يَوْمٍ عَظِيمٍ {189}	එවිට ඔවුහු ඔහු බොරු කළෝය. එහෙයින් අඳුරු (වළාවෙන්) ආවරණ කරන දිනයේ දඬුවම ඔවුන් ග්‍රහණය කළේය. නියත වශයෙන්ම එය දරුණු දිනයක දඬුවමක් විය.
إِنَّ فِي ذَٰلِكَ لَآيَةً ۖ وَمَا كَانَ أَكْثَرُهُمْ مُؤْمِنِينَ {190}	නියත වශයෙන්ම එහි සංඥාවක් විය. තවද ඔවුන්ගෙන් බහුතරයක් දෙනා දෙවියන් විශ්වාස කරන්නන් නොවූහ.
وَإِنَّ رَبَّكَ لَهُوَ الْعَزِيزُ الرَّحِيمُ {191}	තවද නියත වශයෙන්ම නුඹගේ පරමාධිපතියාණන් වන ඔහුමය සර්වබලධාරී, මහාකරුණාන්විත යාණන්.

192-212. ශුද්ධ වූ අල් කුර්ආනය එහි මූලය හා ඒ පිළිබඳ ව දේව ආදේශකයින්ගේ ස්ථාවරය.

وَإِنَّهُ لَتَنْزِيلُ رَبِّ الْعَالَمِينَ {192}	තවද නියත වශයෙන්ම මෙය ලෝවැසියන්ගේ පරමාධිපතිගෙන් වූ පහළ කිරීමකි.

نَزَلَ بِهِ الرُّوحُ الْأَمِينُ {193} عَلَىٰ قَلْبِكَ لِتَكُونَ مِنَ الْمُنْذِرِينَ {194} بِلِسَانٍ عَرَبِيٍّ مُبِينٍ {195}

නුඹ අවවාද කරන්නන් අතුරින් වනු පිණිස පැහැදිලි අරාබි බසින් නුඹේ හදවතට විශ්වාසනීය ආත්මය එය රැගෙන පහළ විය.

وَإِنَّهُ لَفِي زُبُرِ الْأَوَّلِينَ {196}

තවද නියත වශයෙන්ම එය මුතුන් මිත්තන්ගේ ග්‍රන්ථ වල විය.

أَوَلَمْ يَكُنْ لَهُمْ آيَةً أَنْ يَعْلَمَهُ عُلَمَاءُ بَنِي إِسْرَائِيلَ {197}

තවද ඉස්රාඊල් දරුවන්ගේ විද්වත්හු ඒ ගැන දැන සිටීම ඔවුනට සංඥාවන් නොවී ද?

وَلَوْ نَزَّلْنَاهُ عَلَىٰ بَعْضِ الْأَعْجَمِينَ {198} فَقَرَأَهُ عَلَيْهِمْ مَا كَانُوا بِهِ مُؤْمِنِينَ {199}

තවද අරාබි නොවන ඇතැමුන් වෙත අපි එය පහළ කොට එය ඔහු ඔවුනට කියවා පෙන්වූයේ නම් ඔවුහු ඒ ගැන විශ්වාස කරන්නන් නොවනු ඇත.

كَذَٰلِكَ سَلَكْنَاهُ فِي قُلُوبِ الْمُجْرِمِينَ {200}

වැරදිකරුවන්ගේ හදවත් තුළ අපි එය ඇතුළත් කළේ එලෙසය.

لَا يُؤْمِنُونَ بِهِ حَتَّىٰ يَرَوُا الْعَذَابَ الْأَلِيمَ {201}

වේදනීය දඬුවම ඔවුන් දකින තෙක් ඒ පිළිබඳ ව ඔවුහු විශ්වාස නොකරති.

فَيَأْتِيَهُمْ بَغْتَةً وَهُمْ لَا يَشْعُرُونَ {202}

එහෙයින් ඔවුන් නොහඟමින් සිටියදී ක්ෂණික ව ඔවුන් වෙත එය (දඬුවම) පැමිණෙනු ඇත.

فَيَقُولُوا هَلْ نَحْنُ مُنْظَرُونَ {203}

එවිට ඔවුහු අප කල් දෙනු ලබන්නන් වන්නෙමු දැ?යි අසති.

أَفَبِعَذَابِنَا يَسْتَعْجِلُونَ {204}

එසේනම් ඔවුහු අපගේ දඬුවම ඉක්මණින් පතන්නෙහු ද?

أَفَرَأَيْتَ إِنْ مَتَّعْنَاهُمْ
سِنِينَ {205} ثُمَّ جَاءَهُمْ مَا
كَانُوا يُوعَدُونَ {206} مَا
أَغْنَىٰ عَنْهُمْ مَا كَانُوا
يُمَتَّعُونَ {207}

ඔවුනට වසර ගණනාවක් අප භුක්ති විදීමට සලස්වා පසු ව ඔවුනට පොරොන්දු දෙනු ලබමින් සිටි දෑ ඔවුන් වෙත පැමිණි විට ඔවුන් භුක්ති විදිමින් සිටි දෑ ඔවුනට ඵලක් නොවනු ඇත.

وَمَا أَهْلَكْنَا مِنْ قَرْيَةٍ إِلَّا لَهَا
مُنْذِرُونَ {208}

තවද කිසිදු ගම්මානයක් එහි අනතුරු අඟවන්නන්ගෙන් තොර ව අපි විනාශ නොකළෙමු.

ذِكْرَىٰ وَمَا كُنَّا
ظَالِمِينَ {209}

(මෙය අල්ලාහ්ගේ දඬුවම ගැන) මෙනෙහි කිරීමකි. තවද අපි අපරාධකරුවන් නොවූයෙමු.

وَمَا تَنَزَّلَتْ بِهِ
الشَّيَاطِينُ {210}

තවද ෂෙයිතානුන් එය පහළ නොකළහ.

وَمَا يَنْبَغِي لَهُمْ وَمَا
يَسْتَطِيعُونَ {211}

තවද ඔවුනට එය අවශ්‍ය (කාර්යයක්) නොවීය. තවද ඔවුහු එයට ශක්තිය නොදරති.

إِنَّهُمْ عَنِ السَّمْعِ
لَمَعْزُولُونَ {212}

නියත වශයෙන්ම ඔවුහු (එයට) සවන්දීමෙන් ඉවත් කරනු ලැබූවන් වෙති.

213-220. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට දේව උපදෙස්.

فَلَا تَدْعُ مَعَ اللَّهِ إِلَٰهًا آخَرَ

එහෙයින් නුඹ අල්ලාහ් සමග වෙනත් දෙවියකු ඇරයුම් නොකරනු. එවිට නුඹ දඬුවම් කරනු

فَتَكُونَ مِنَ الْمُعَذَّبِينَ {213}

ලබන්නන් අතුරින් කෙනෙකු වන්නෙහිය.

وَأَنْذِرْ عَشِيرَتَكَ الْأَقْرَبِينَ {214}

තවද නුඹගේ සමීප ඥාතීන්ට නුඹ අවවාද කරනු.

وَاخْفِضْ جَنَاحَكَ لِمَنِ اتَّبَعَكَ مِنَ الْمُؤْمِنِينَ {215}

තවද දෙවියන් කෙරෙහි විශ්වාස කරන්නන් අතුරින් නුඹ ව අනුගමනය කළවුන් හට නුඹගේ පියාපත් පහත් කරනු.

فَإِنْ عَصَوْكَ فَقُلْ إِنِّي بَرِيءٌ مِمَّا تَعْمَلُونَ {216}

නමුත් ඔවුහු නුඹට පිටුපෑවෙහු නම්, නියත වශයෙන්ම නුඹලා සිදු කරන දැයින් මම නිදහස් වූ අයෙකි යැයි නුඹ පවසනු.

وَتَوَكَّلْ عَلَى الْعَزِيزِ الرَّحِيمِ {217}

තවද නුඹ සර්ව බලධාරී මහාකරුණාන්විතයාණන් මත (සියල්ල) භාර කරනු.

الَّذِي يَرَاكَ حِينَ تَقُومُ {218} وَتَقَلُّبَكَ فِي السَّاجِدِينَ {219}

ඔහු වනාහි නුඹ නැගිට නැමදුම් කරන විට ද සුජූද් කරන්නන් අතර නුඹගේ චලනය ද ඔහු දකින්නාය.

إِنَّهُ هُوَ السَّمِيعُ الْعَلِيمُ {220}

නියත වශයෙන්ම ඔහුමය සර්ව ශ්‍රාවක සර්ව ඥානී.

221-227. දේව ආදේශකයින් වෙත වූ ප්‍රතිචාරය හා ඔවුනට අවවාද කිරීම.

هَلْ أُنَبِّئُكُمْ عَلَى مَنْ تَنَزَّلُ الشَّيَاطِينُ {221}

ෂෙයිතානුන් පහළ වන්නේ කවුරුන් වෙත දැයි මම නුඹලාට දන්වන්න ද?

تَنَزَّلُ عَلَى كُلِّ أَفَّاكٍ

පාපකම් කරන බොරු ගොතන සෑම කෙනෙකු වෙතම ඔහු පහළ වෙයි.

أَثِيمٍ {222}

يُلْقُونَ السَّمْعَ وَأَكْثَرُهُمْ كَاذِبُونَ {223}

සවනට වැකුණු දෑ ඔවුහු ඉදිරිපත් කරති. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා මුසාවාදීහුය.

وَالشُّعَرَاءُ يَتَّبِعُهُمُ الْغَاوُونَ {224}

තවද කවිවරුන් වන ඔවුන් ව නොමග ගියවුන් අනුගමනය කරති.

أَلَمْ تَرَ أَنَّهُمْ فِي كُلِّ وَادٍ يَهِيمُونَ {225}

නියත වශයෙන්ම ඔවුන් සෑම මිටියාවතකම නිදැල්ලේ හැසිරෙනු නුඹ නොදුටුවෙහි ද?

وَأَنَّهُمْ يَقُولُونَ مَا لَا يَفْعَلُونَ {226}

තවද නියත වශයෙන්ම ඔවුහු තමන් සිදු නොකරන දෑ පවසති.

إِلَّا الَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ وَذَكَرُوا اللَّهَ كَثِيرًا وَانْتَصَرُوا مِنْ بَعْدِ مَا ظُلِمُوا ۗ وَسَيَعْلَمُ الَّذِينَ ظَلَمُوا أَيَّ مُنْقَلَبٍ يَنْقَلِبُونَ {227}

නමුත් විශ්වාස කර යහකම් කර අල්ලාහ් ව අධික වශයෙන් මෙනෙහි කර අපරාධ කරනු ලැබූවායින් පසු උදව් කරනු ලැබූවන් හැර. තමන් කවර තැනකට යොමු කරනු ලබන්නේ දැයි අපරාධ කළවුන් මතු දැන ගනු ඇත.

IslamHouse.com